සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංගකලාව - I

නම/විභාග අංකය :- ................................................................ කාලය: පැය 01යි.

<u>සැලකිය යුතුයි.</u>

(1) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(2) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

(3) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) කතන්දරයට අදාළ ප්‍රකාශය නොවන්නේ,

(1) සින්දු මාලාවක් අනුපිළිවෙලින් ප්‍රකාශ කිරීමකි. (2) කියවා අසා රස විඳීමට තිබෙන්නකි.

(3) කතා වස්තුවේ විකාශය කෙටි කාලීන වූවකි. (4) සංවාද ඇතුළත් දීර්ඝ කතා පුවතක් සහිත වූවකි.

(02) ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවක් ලෙස සැලකේ.

(1) චිත්‍ර (2) මූර්ති (3) ඔපෙරා (4) නැටුම්

(03) වස්තු කාලය හා රංග කාලය යනු,

(1) කතා වස්තුව විකාශනය වන කාලය සහ රංගය විකාශනය වන කාලය වේ.

(2) කතා වස්තුව අයත් යුගය හා රංග ගතවන යුගය පිළිබඳ වේ.

(3) කතා වස්තුවට අයත් කාලය සහ රංගයට අයත් කාලය වේ.

(4) කථා පුවත හා රූපණ කාර්ය වේ.

(04) වේදිකා නාට්‍යයක් හා සම්බන්ධ වන කලා ප්‍රභේදයක් නොවන්නේ,

(1) සාහිත්‍ය කලාව (2) ආහාර්ය කලාව

(3) චිත්‍ර හා මූර්ති කලාව (4) නර්තන කලාව

(05) නළුවෙකුට රූපණ කාර්ය සාර්ථක කර ගැනීමට අත්‍යවශ්‍යය නොවන්නේ,

(1) පරිකල්පනයයි. (2) නිර්මාණශීලීත්වයයි.

(3) රංග අභ්‍යාසයයි. (4) ගායන හැකියාවයි.

(06) රූපණය කාලයක් තිස්සේ පුහුණු විය යුත්තකි. පුහුණු වීමේ දී නළුවන් විසින් ප්‍රගුණ කළ යුතු අංග වන්නේ,

(1) ඇස හා ශරීරය (2) සිත, ශරීරය සහ කටහඬ

(3) කටහඬ සහ ශරීරය (4) අංග චලන හා කටහඬ

(07) වැරදි සම්බන්ධතාවය වන්නේ,

(1) කමත - සොකරි (2) කරලිය - නාඩගම්

(3) යාග භූමිය - නූර්ති (4) තානායම් පොළ - කෝලම්

(08) "සිසුන් හොඳින් ඉඩ ඇති අවකාශයක ඇවිදිමින් සිටී. ගුරුවරයා වරින්වර අංකයක් කියූ විට එම අංකයට අදාළ ගණන එකිනෙකා අල්ලා ගනිමින් පෙන්වයි." මෙම රංග අභ්‍යාසය මගින් වර්ධනය කරගත හැක්කේ,

(1) ගණිත සංකල්පය පිළිබඳ හැකියාවයි.
(2) අවධානයෙන් කටයුතු කිරීමේ හැකියාවයි.
(3) ආංගික අභිනය පෑමේ හැකියාවයි.
(4) සාමූහිකව කටයුතු කිරීමේ හැකියාවයි.

(09) "පන්ති කාමරයට පරෙවියකු පැමිණීම" යන මාතෘකාව වඩාත් සුදුසු වන්නේ,

(1) ක්ෂණික නිරූපණයක් සඳහා ය.
(2) ළමා නාට්‍යයක් සඳහා ය.
(3) වැඩිහිටි නාට්‍යයක් සඳහා ය.
(4) පාසල් නාට්‍යයක් සඳහා ය.

(10) නාට්‍යමය අවස්ථාවක ලක්ෂණයක් නොවන්නේ,

(1) ගැටුම (2) කුතුහලය (3) දෙබිඩියාව (4) ශෝකය

(11) සංවාද කොටස් හඬනගා කියවීමට හැකියාව ලබාදෙන රංග අභ්‍යාසයක් වන්නේ,

(1) සංවේදන අභ්‍යාස
(2) ශිථිලකරණ අභ්‍යාස
(3) ශ්වසන අභ්‍යාස
(4) චරිත ඒකාග්‍රතාව පිළිබඳ අභ්‍යාස

(12) "හිම කන්ද අභ්‍යාසය" සිසුන් සමග කිරීමෙන්,

(1) ශරීරාංග සැහැල්ලු කරගැනීමට හැකිවේ.
(2) ක්ෂණිකව ක්‍රියා කිරීමේ හැකියාව ලැබේ.
(3) කායික හා මානසික ශක්තිය ලැබේ.
(4) කටහඬෙහි නම්‍යතාවය ඇතිවේ.

(13) නාට්‍ය ධර්මී ශෛලියෙන් නිර්මාණය වූ නාට්‍යයක් නොවන්නේ,

(1) කුවේණි (2) හුණුවටයේ කතාව (3) බෙරහඬ (4) සුභ සහ යස

(14) නිවැරදි සම්බන්ධතාවය වන්නේ,

(1) කෙළ හැඩුරුවයි - පුත තොවිලන් - හුණුවටයේ කතාව
(2) මූදු පතුළ යට ඉඳලා - පාලම් යට
(3) ඇහැළ මලින් ගස් පිරිලා - රතු හැට්ටකාරී
(4) ජෝබාව දේ මෙපුර - නරිබෑනා

(15) රංග භාණ්ඩ සෑම විටම

(1) ශක්තිමත් ද්‍රව්‍යවලින් සකස් කළ යුතුය.
(2) සරල සහ සැහැල්ලු ස්වභාවයක් ගත යුතු ය.
(3) පැරණි ද්‍රව්‍යයම යොදාගෙන සකස් කළ යුතු ය.
(4) සෑම නාට්‍යයක් සඳහා ම යොදා ගත යුතුයි.

(16) නළුවරණය යනුවෙන් හඳුන්වන්නේ,

(1) වේදිකාවට එන නළුවන් හඳුන්වාදීමයි.
(2) නළුවන්ට අවශ්‍ය උපදෙස් ලබාදීමයි.
(3) චරිත සඳහා සුදුසු නළුවන් තෝරා ගැනීමයි.
(4) නළුවන් අදාළ චරිතයට පුහුණු වීමයි.

(17) සම්ප්‍රදායන් තුනට ම පොදු වූ ශාන්ති කර්මයකි.

(1) දෙවොල් මඩුව
(2) බලියාග
(3) කොහොඹා කංකාරිය
(4) ගරා මඩුව

(18) ශෛලිගත සම්ප්‍රදායෙන් දේශීය ජීවන ප්‍රශ්න නාට්‍යයට නංවා ඇති නාට්‍ය කෘතියක් වන්නේ,

(1) හුණුවටය නාට්‍යය
(2) කුවේණි නාට්‍යය
(3) අපිට පුතේ මඟක් නැතේ නාට්‍යය
(4) ජනේලය නාට්‍යය

(19) චලන මූලික වශයෙන් දුනේද

(1) තුනකි. (2) දෙකකි. (3) හතරකි. (4) පහකි.

(20) තමාගේ පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරන චලනයක් වන්නේ.

(1) ස්වාභාවික චලන (2) නිර්මිත චලන

(3) තාලානුකූල චලන (4) මේ කිසිවක් නොවේ.

| නාට්‍යකරු | මුල් නාට්‍ය | අනුවර්තනය / පරිවර්තනය නම | අනුවර්තක / පරිවර්තකගේ නම |
|---|---|---|---|
| ජූලියස් හේ | A | තුරඟ සත්තිය | B |
| C | ප්‍රේමතෝ ජායතී සෝකෝ | ............................ | ............................ |
| D | ඉත්තෙවුවා ශු | E | බන්දුල ජයවර්ධන |
| F | සුදු රන කළු | ............................ | ............................ |

(21) A සහ B යන අක්ෂර දෙකට අයත් නම් වන්නේ,

(1) ජූලියස් සීසර් - විලියම් ෂේක්ස්පියර් (2) ද හෝස් - සුගතපාල ද සිල්වා

(3) ද බ්‍රැගත් - හෙන්රි ජයසේන (4) විල්ඩි වෙබ්ස් - කොගලගා ප්‍රනාන්දු

(22) "C" අක්ෂරයෙන් දැක්වෙන නාට්‍යකරුවා වන්නේ,

(1) එදිරිවීර සරච්චන්ද්‍ර ය. (2) ජේ. ඩී. පෙරේරා ය.

(3) ප්‍රේමරංජිත් තිලකරත්න ය. (4) රංජිත් ධර්මකීර්ති ය.

(23) "D" යන අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) සංස්කෘත නාට්‍යකරුවෙකි. (2) ජපන් නාට්‍යකරුවෙකි.

(3) රුසියානු නාට්‍යකරුවෙකි. (4) ග්‍රීක නාට්‍යකරුවෙකි.

(24) "E" අක්ෂරයට යෙදිය යුතු නාට්‍යයේ නම වන්නේ,

(1) ජනේලය (2) හුණුවටයේ කතාව

(3) බෙරහඬ (4) අහස් මාළිගා

(25) "F" යන අක්ෂරයට යෙදෙන නාට්‍යකරුවාගේ නම,

(1) හෙන්රි ජයසේන (2) සයිමන් නවගත්තේගම ය.

(3) පරාක්‍රම නිරිඇල්ල ය. (4) දයානන්ද ගුණවර්ධන ය.

(26) මෙරට පවත්වන නාට්‍ය සම්මාන උත්සවයක් ලෙස සැලකිය නොහැක්කේ,

(1) සරසවි සම්මාන උළෙල (2) ගොවින සම්මාන උළෙල

(3) සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංගකලා උළෙල (4) ජාතික නාට්‍ය උළෙල

(27) 2016වර්ෂයේ ජාතික නාට්‍ය උළෙලේ හොඳම නාට්‍ය වූ 'රජා මං වහලා' නාට්‍ය අධ්‍යක්ෂණය කරනු ලැබුවේ,

(1) බුද්ධික දමයන්ත (2) නන්දන අල්ගෙවත්ත

(3) කපිල කුමාර කාලිංග (4) චාමික හත්ලහවත්ත

(28) ග්‍රීසිය නාට්‍ය කලාව සම්බන්ධව වැදගත් වන්නේ,

(1) දියුණු නාට්‍ය කලාවක් පවතින බැවින්.

(2) නාට්‍ය කලාවේ ප්‍රභවය සිදු වූ බැවින්

(3) ලෝකයේ විශාලතම එළිමහන් රංග පීඨය ඇති බැවින්

(4) උසස් ග්‍රීක නාට්‍ය රැසක් බිහිවී ඇති බැවින්

(29) නිවැරදි සම්බන්ධතාවය වන්නේ,

(1) ගැමි නාටකය - එදිරිවීර සරච්චන්ද්‍ර

(2) නාට්‍ය ශාස්ත්‍රය - ඇරිස්ටෝටල්

(3) නාට්‍ය ශාස්ත්‍රය - භරතමුනි

(4) අභිනය දර්පණය - ධනංජය

(30) වැරදි සම්බන්ධතාවය වන්නේ,

(1) පුංචි අපිට දැන් තේරෙයි - ළමා නාට්‍යයක්

(2) හඳයා - ළමා චිත්‍රපටයක්

(3) හියැපෙව් බෝනික්කා - ළමා ගීයක්

(4) සතළු රන - ළමා නව කතාවක්

(31) නිවැරදි නොවන ප්‍රකාශය වන්නේ,

(1) ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත.

(2) නාට්‍යයේ චරිත අතර ගැටුම් ඇතිවිය හැක.

(3) නාට්‍යයක ඇති ගැටුම් අවස්ථා පෙන්වීමට චරිත අවශ්‍ය නොවේ.

(4) නාට්‍යයේ පුද්ගලයා හා සමාජය අතර ගැටුම් ඇතිවිය හැක.

(32) සමාරෝපය....

(1) බාහිර හා අභ්‍යන්තරික වශයෙන් කොටස් දෙකකි.

(2) නාට්‍ය ධර්ම හා ලෝක ධර්ම අනුව වෙනස් වේ.

(3) ශාරීරික රංගනයක් සඳහා අත්‍යවශ්‍යම නොවේ.

(4) නළුවාගේ පෞද්ගලිකත්වය ඉතා හොඳින් මතුකර දීමකි.

(33) නැවත නැවතත් වෙනස් කළ හැකි කලාංගයක් වන්නේ,

(1) ටෙලි නාට්‍යය (2) වේදිකා නාට්‍යය

(3) චිත්‍රපට (4) නවකතා

(34) "මංගලම් සිංදුව" ඇසිය හැකි වන්නේ,

(1) නාට්‍යයක අවසානයේ ය. (2) නාට්‍යයක ආරම්භයේ ය.

(3) නාට්‍යයක විවේකයට පෙර ය. (4) නාට්‍ය දර්ශන 2ක් අතර ය.

(35) යසලාලක තිස්ස රජු සහ සුභ නම් ද්වාර පාලකයා සම්බන්ධ කථා පුවතක් අවංශු නාට්‍ය කෘතියට පදනම් වන්නේ.

(1) ජාතක කථාවකි. (2) ජන කථාවකි.

(3) ඓතිහාසික කථාවකි. (4) දේව කථාවකි.

(36) ඡායාරූපයේ සිටින්නේ,



(1) සුගතපාල ද සිල්වා ය.

(2) විජය නන්දසිරි ය.

(3) හෙන්රි ජයසේන ය.

(4) ජැක්සන් ඇන්තනී ය.

(37) ඡායාරූපයේ සිටින්නේ,



(1) අනුලා බුලත්සිංහල ය.

(2) මාලනී ජයරත්න ය.

(3) අයිරාංගනී සේරසිංහ ය.

(4) රත්නා ලාලනී ය.

(38) ඡායාරූපයේ දැක්වෙන්නේ.



(1) ප්‍රකට රංග වින්‍යාසකරුවෙකි.
(2) ප්‍රකට චිත්‍රපට නළුවෙකි.
(3) ප්‍රකට සිනමා අධ්‍යක්ෂවරයෙකි.
(4) ප්‍රකට ටෙලි නාට්‍යකරුවෙකි.

(39) ඡායාරූපයේ දැක්වෙන්නේ.



(1) මෝදර මෝල නාට්‍යයේ දර්ශනයකි.
(2) නැතුවම බැරි මිනිහෙක් නාට්‍යයේ දර්ශනයකි.
(3) කැලණි පාලම නාට්‍යයේ දර්ශනයකි.
(4) එයාරි නාට්‍යයේ දර්ශනයකි.

(40) ඡායාරූපයේ දැක්වෙන්නේ.



(1) පන්දම් පාලියට අයත් මුහුණකි.
(2) කෝලම් නාට්‍යයට අයත් මුහුණකි.
(3) සොකරි නාට්‍යයට අයත් මුහුණකි.
(4) සන්නියකුමට අයත් මුහුණකි.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංගකලාව - II

නම/විභාග අංකය :- .................................................. කාලය: පැය 02යි.

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එම ප්‍රශ්නය සමඟ තවත් ප්‍රශ්න 04කට පිළිතුරු ලියන්න.

(01) කෝලම් කරත්තේ නැතිව ගඟෙන් එතෙර වෙන්න. මේ පනියා කියන හැටියට වැඩ කළොත් හොඳයි. මේ සනියෝ පළමුව මේ ඇත්තාව එගොඩ කරන්න.

(1) මෙම සංවාද ඛණ්ඩය අයත් නාට්‍ය සහ එහි කතුවරයාගේ නම සඳහන් කරන්න. (ලකුණු 02)

(2) මේ සංවාදය ප්‍රකාශ කරන්නේ කවුරුන් විසින් කාහට ද? (ලකුණු 02)

(3) මෙහි ඇත්තා යනුවෙන් සඳහන් වන්නේ කවුරු ද? (ලකුණු 02)

(4) මෙම සංවාදයෙන් නිරූපිත අවස්ථාව කුමක් ද? (ලකුණු 02)

(5) එම අවස්ථාව අවසන් වන අයුරු සඳහන් කරන්න. (ලකුණු 02)

(6) මෙම නාට්‍යයෙන් ප්‍රකාශ වන තේමාව සඳහන් කරන්න. (ලකුණු 02)

(02) (1) නෘත්ත හා නෘත්‍ය යන්න කෙටියෙන් පහදන්න. (ලකුණු 02)

(2) නෘත්ත හා නෘත්‍ය සඳහා උදාහරණ 2ක බැගින් දක්වන්න. (ලකුණු 04)

(3) නෘත්ත හා නෘත්‍යයෙන් නාට්‍යය වෙනස් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (1) අංග රචනය සඳහා මුහුණ ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් නම් කරන්න. (ලකුණු 02)

(2) අංග රචනය ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් විස්තර කරන්න. (ලකුණු 04)

(3) අංග රචනයේ දී ශිල්පියා මූලික වශයෙන් ම සැලකිලිමත් විය යුතු කරුණු 4ක් සඳහන් කරන්න. (ලකුණු 06)

(04) (1) පහතරට ප්‍රදේශයේ ප්‍රචලිත යක් තොවිල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(2) එම යක් තොවිල් වල අන්තර්ගත නාට්‍යමය පෙළපාළි 1ක් බැගින් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) ඉන් ඔබ කැමති එක් නාට්‍යමය පෙළපාළියක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(05) ලංකාවේ නාට්‍ය කලාවේ සම්මත රංග භූමි වෙනස් කළ පුරෝගාමී නාට්‍යකරුවෙකි. පරාක්‍රම නිරිඇල්ල

(1) ඔහු විසින් අධ්‍යක්ෂණය කර ඇති නාට්‍ය 3ක් නම් කරන්න. (ලකුණු 03)

(2) ඔහු විසින් නිර්මාණය කර ඇති චිත්‍රපට 1ක් සහ ටෙලි නාට්‍යය 2ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) පරාක්‍රම නිරිඇල්ල සම්මත වේදිකාවෙන් බැහැරව වෙනස් ආකාරයේ රංගභූමි භාවිතයන් සහිත නාට්‍ය කළ අයෙකි. මේ පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 06)

(06) (1) ඔබ කියවූ නාට්‍ය පිටපතක දැකිය හැකි මූලික ලක්ෂණ 04ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(2) එම නාට්‍ය පිටපත වේදිකා රංගයක් බවට පත්කර ගැනීමේ දී සම්බන්ධ වන ප්‍රධාන ශිල්පීන් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) නාට්‍ය යනු සාමූහිකත්වයක ප්‍රතිඵලයකි. යන ප්‍රකාශය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

(07) පහත දැක්වෙන කතා සැකිල්ල ඇසුරු කරගෙන කෙටි නාට්‍ය පිටපතක් රචනා කරන්න. ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩුවැඩි කරගත හැකි ය.

"මහා ඝන කැලය මැදින් බයෙන් බයෙන් ගමන් ගන්නා පිරිපාලු මඳත් වෙහෙස නිවා ගැනීමට රජ්ජ තුග ගසක් මුල වාඩි වූවා පමණි."

(1) නාටෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)

(2) සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 08)